වැඩිහිටි තැනැත්තන් සඳහා වන
ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய
சபை மற்றும் தேசிய செயலகம்
National Council and Secretariat for Elders

# ප්‍රගති සමාලෝචන රැස්වීම්

# හා

# පසු විපරම් කටයුතු

# 2025

**ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය**

## 2025 වර්ෂයේ ප්‍රගති සමාලෝචන රැස්වීම් හා පසු විපරම් කටයුතු සිදුකල දිස්ත්‍රික්ක

- හම්බන්තොට දිස්ත්‍රික්කය
- මඩකලපුව දිස්ත්‍රික්කය
- පොළොන්නරුව දිස්ත්‍රික්කය
- යාපනය දිස්ත්‍රික්කය
- අම්පාර දිස්ත්‍රික්කය
- කළුතර දිස්ත්‍රික්කය

වැඩිහිටි තැනැත්තන් සඳහා වන
ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய
சபை மற்றும் தேசிய செயலகம்
National Council and Secretariat for Elders

# හම්බන්තොට දිස්ත්‍රික්කය

## ප්‍රගති සමාලෝචන රැස්වීම හා පසු විපරම් වාර්තාව

## 2025.06.20 / 21

## ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

දිනය - 2025.06.20

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - තංගල්ල

තංගල්ල යායවත්ත ඉඩම පරීක්ෂා කිරීම හා එහි වර්තමාන තත්ත්වය












**<u>හම්බන්තොට දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම</u>**

දිනය - 2025.06.20

ස්ථානය - හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

ප්‍රධානත්වය - එම්.කේ.ඒ.ඒ අමාලි මිය, අතිරේක දිස්ත්‍රික් ලේකම්

සහභාගීත්වය -

1. කේ. චතුර මිහිඳුම් මයා - අධ්‍යක්ෂ, ජතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
2. නිලංග කුමාර මයා - දිස්ත්‍රික් වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි
3. එස්.ඊ. නිහාල් ජයන්ත මයා - අගුණකොළපැලැස්ස - වැ.හි.ප්‍ර.නි
4. ආර්.පී. වීරවර්ධන මයා - බෙලිඅත්ත ප්‍රා.ලේ.කා - වැ.හි.ප්‍ර.නි
5. එම්.ඩී. අමිතා මිය - ඕකේවෙල ප්‍රා.ලේ.කා - වැ.හි.ප්‍ර.නි
6. පී.එම්.එස්. රෝචනී මිය - ලුණුගම්වෙහෙර ප්‍රා.ලේ.කා - වැ.හි.ප්‍ර.නි (සං)
7. බී.එම්.ටී. නිසංසලා මිය - සූරියවැව ප්‍රා.ලේ.කා - වැ.හි.ප්‍ර.නි (සං)
8. කේ.ජී. දිලිනි හර්ෂා මිය - අම්බලන්තොට ප්‍රා.ලේ.කා - වැ.හි.ප්‍ර.නි (සං)
9. අයි.සී.එල්. සමරසේකර මිය - වලස්මුල්ල ප්‍රා.ලේ.කා - වැ.හි.ප්‍ර.නි
10. වී.කේ. ලක්මාලි මිය - හම්බන්තොට ප්‍රා.ලේ.කා - වැ.හි.ප්‍ර.නි (සං)
11. නිලධාරියෙකු නොමැත - තිස්සමහාරාමය ප්‍රා.ලේ.කා
12. සිරිවර්ධන මහතා - කටුවන ප්‍රා.ලේ.කා - වැ.හි.ප්‍ර.නි - (සහභාගී නොවන ලදී.)
13. ජේ.බී.ශ්‍රියාණි කාන්ති මිය - වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි - ප්‍රධාන කාර්යාලය
14. සුරේකා ශ්‍යාමිලා මිය - වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි - ප්‍රධාන කාර්යාලය
15. රවින්ද්‍ර සුනිමල් මයා - වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි - ප්‍රධාන කාර්යාලය
16. චානක චන්දිම මයා - කළමනාකරණ සේවා නිලධාරි - ප්‍රධාන කාර්යාලය

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය යටතේ 2024 වර්ෂයේ ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සම්බන්ධයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් නිලධාරීන්ගේ ප්‍රගතිය සමාලෝචනය කරන ලදී. තවද, 2025 වර්ෂයේ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයෙන් සිදු කරනු ලබන වැඩසටහන් සම්බන්ධව වැඩිදුරටත් දැනුවත් කිරීම සිදු කරන ලදී.

ප්‍රගති සමාලෝචන රැස්වීමේදී සාකච්ඡා කරන ලද කරුණු.

01. අධ්‍යක්ෂතුමා විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ජුනි මස වැඩිහිටි දීමනා ලාභීන් සංඛ්‍යාව විමසන ලද අතර, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු පහත සඳහන් වේ.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුළු දීමනා ලාභීන් සංඛ්‍යාව - 8,528

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | දීමනා ලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අඟුණකොළපැලැස්ස | 653 |
| 02 | බෙලිඅත්ත | 928 |
| 03 | ඕකේවෙල | 429 (තැපැල්) / 516 (අස්වැසුම) |
| 04 | ලුණුගම්වෙහෙර | 250 |
| 05 | සූරියවැව | 685 (තැපැල්) |
| 06 | අම්බලන්තොට | 924(තැපැල්) |
| 07 | වලස්මුල්ල | 632(තැපැල්)/ 1051 (අස්වැසුම) |
| 08 | හම්බන්තොට | 524(තැපැල්) |

**02. රාජකාරි ඉටු කිරීමේදී මතුවන ගැටළු ඉදිරිපත් කිරීම.**

- වැඩිහිටි ප්‍රතිලාභීන්ගේ හැඳුනුම්පත නොමැති වීම, නම් වෙනස් වීම, පදිංචිය මාරු කිරීම හේතුවෙන් වැඩිහිටි දීමනාව හා අස්වැසුම සම්බන්ධයෙන් ගැටළු මතු වීම.
- හම්බන්තොට දිස්ත්‍රික්කයේ සංවර්ධන නිලධාරි සඳහා ගමන් වියදම් ලබා නොදීම.
- වැඩිහිටි සත්කාරක පුහුණු කිරීමේ වැඩසටහන සඳහා සහභාගී වූ නිලධාරීන්ට ඒ සඳහා වන සහතිකපත් නොලැබීම.
- 2024 වර්ෂයේ ලබාදී ඇති ආධාර මුදල් වෙනුවෙන් මෙතෙක් අදාළ ලදුපත් හා වාර්තා එවා නොමැති නම් ඒවා කඩිනමින් ලබාදෙන මෙන් නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.
- සුවපහසු මුල්‍යාධාර වැඩසටහන ක්‍රියාත්මක වීමේදී ඇතිවන ප්‍රායෝගික ගැටළු -
  - තාක්ෂණික නිලධාරියා විසින් සකස් කරන ලද ඇස්තමේන්තුව විශාල අගයක් ගන්නා බැවින් ප්‍රතිලාභියා විසින් සපයා ගත යුතු මුදල විශාල අගයක් ලෙස දැක්වීම.
  - ප්‍රතිලාභියා වෙත කොටස් වශයෙන් මුදල් ආධාර ලබා දීමට ඉල්ලීම් කිරීම.
- වැඩිහිටි හැඳුනුම්පත් ජංගම සේවාවක් පැවැත්වීම අවශ්‍ය බවට ඉල්ලීම් සිදු කරන ලදී.

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් 2024 වර්ෂයේ ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සම්බන්ධයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ පසුවිපරම් කටයුතු සිදුකිරීම.

**දිනය - 2025.06.21**

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - සූරියවැව**

01. **දිරිය පියස නිවාස යෝජනා ක්‍රමය යටතේ ආධාර ලබා දීම.**
    - ග්‍රාම නිලධාරි වසම - වැදිවැව
    - ප්‍රතිලාභියාගේ නම - ටී.ජී. ගුණදාස මයා
    - ප්‍රතිලාභියාගේ වයස - අවුරුදු 72
    - ලබාදුන් මුදල/වර්ෂය - රු.700,000.00/ 2024
    - ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය - 80%ක ප්‍රමානය වැඩ අවසන් කර ඇත.
    - වෙනත් කරුණු - අස්වැසුම හා වැඩිහිටි දීමනාව හිමි පුද්ගලයෙකි.









**02. වැඩිහිටි සමිති සවිබලගැන්වීම වෙනුවෙන් ආධාර ලබාදීම.**

- ග්‍රාම නිලධාරි වසම - බැද්දේවැව
- වැඩිහිටි සමිතියේ නම - බැද්දේවැව පුබුදු වැඩිහිටි සමිතිය
- ආරම්භ කරන ලද වර්ෂය - 2011
- ලබාදුන් මුදල/වර්ෂය - රු.100,000.00 /2024
- මිලදී ගන්නා ලද භාණ්ඩ - ප්ලාස්ටික් පුටු 53ක්
- වෙනත් කරුණු - ඉහත සමිතිය විසින් විශේෂ රැස්වීම් වාරයක් පවත්වන ලද අතර, එහි ගරු ලේකම්තුමා විසින් අධ්‍යක්ෂතුමා ඇතුළු සහභාගී වූ නිලධාරීන් පිළිගන්නා ලදී. වැඩිදුරටත් අදහස් දක්වන ලද ගරු ලේකම්තුමා විසින් පහත කරුණු ඉදිරිපත් කරන ලදී.
  - ➢ දකුණු පළාතේ සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කරනු ලබන සංහිඳ සඟරාව සමිතියට අවශ්‍ය බව
  - ➢ ගමෙහි උත්සව හෝ අවමංගල්‍ය අවස්ථා වලට ලබාදීම සඳහා කූඩාරම් (tent) ලබා දෙන මෙන් ඉල්ලුම් කිරීම
  - ➢ රු.5,000.00 වැඩිහිටි දීමනාව ලබාගැනීමට සුදුසු පොරොත්තු ලේඛණගත වැඩිහිටියන් සඳහා ද මෙම දීමනාව කඩිනමින් ලබා දීම.
  - ➢ ආබාධ සහිත වැඩිහිටියන් සමිතියේ සිටින බැවින් ඔවුන් වෙත කිහිලිකරු ,ආ රෝද පුටුදී උපකරණ සමිතියට අවශ්‍ය බව

ඉහත කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂතුමා විසින් පහත පරිදි අදහස් දක්වන ලදී.

- ➢ දකුණු පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කරනු ලබන සංහිඳ සඟරාව මේ වන විට මුද්රණය නවතා ඇති බව,
- ➢ 2024 වර්ෂයේ සමිති සවිබලගැන්වීම රු.100,000.00ක් ආධාර මුදල ලබාදුන් බැවින්, නැවත වසර 3ක් යනතුරු ආධාර ලබා දීමට හැකියාව නොමැති බවත්,
- ➢ රජයෙන් වෙනත් ආධාර මුදලක් ලබා නොදනේනම් ඒ සම්බන්ධව සමිතිය දැනුවත් කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී.
- ➢ ජාත්‍යන්තර වැඩිහිටි දිනය වෙනුවෙන් හොඳම වැඩිහිටි සමිතිය තේරීමේදී එම තරඟය වෙනුවෙන් ඉදිරිපත් වන ලෙස උපදෙස් ලබා දීම.






03. ස්වයංරැකියා ආධාර ලබාදීම

(01)

- ව්‍යාපෘතියේ නම - ලුණුදෙහි නිෂ්පාදනය
- ග්‍රාම නිලධාරි වසම - සමාජසේවාපුර
- ප්‍රතිලාභියාගේ නම - ප්‍රේමචන්ද්‍ර විජේසිංහ මයා
- ප්‍රතිලාභියාගේ වයස - අවුරුදු 67
- ලබාදුන් මුදල/වර්ෂය - රු.50,000.00/ 2023
- ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය - ක්‍රියාකාරි මට්ටමේ පවතී.
- වෙනත් කරුණු -
  - ✓ මේ සඳහා භාවිතා කිරීමට අදාළව තරාදිය, ගෑස් ලිපක් හා ගෑස් සිලින්ඩරයක් මිලදී ගෙන ඇත. තවද, අස්වැසුම වැඩසටහන යටතේ වැඩිහිටි දීමනා හිමි පුද්ගලයෙකි.









(02)

- ව්‍යාපෘතියේ නම - රෙදි මැසීම
- ග්‍රාම නිලධාරි වසම - සමාජසේවාපුර නො 01
- ප්‍රතිලාභියාගේ නම - ඒ.ඒම්. විමලසීලි මිය
- ප්‍රතිලාභියාගේ වයස- අවුරුදු 81
- ලබාදුන් මුදල/වර්ෂය- රු.50,000.00/ 2023
- ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය - ව්‍යාපෘතිය ක්‍රියාකාරි මට්ටමේ පවතී.
- වෙනත් -
  - ✓ රෙදි හා නූල් මිලදී ගැනීම ආධාර මුදල් වලින් සිදුකර ඇත. වැඩිහිටි දීමනා හිමි පුද්ගලයෙකි.







(03)

- ව්‍යාපෘතියේ නම - ඉදල් කර්මාන්තය
- ග්‍රාම නිලධාරි වසම - මහගල්ලෑව
- ප්‍රතිලාභියාගේ නම - ඒ.කේ. කරුණාරත්න මයා
- ප්‍රතිලාභියාගේ වයස - අවුරුදු 75
- ලබාදුන් මුදල/වර්ෂය - රු.50,000.00/ 2023
- ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය - ඉදල් ව්‍යාපාරය ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. අමුද්‍රව්‍ය මිලදී ගැනීම, ඉදල් සෑදීමේ මැෂිම මිලදී ගැනීම ආධාර මුදල් යොදා ගෙන සිදුකර ඇත.
- වෙනත් කරුණු -

  ✓ වැඩිහිටි දීමනා හිමි පුද්ගලයෙකි.







**04. වැඩිහිටි නිවාස පරීක්ෂා කිරීම**

- ග්‍රාම නිලධාරි වසම - සූරියවැව නගරය
- වැඩිහිටි නිවාසයේ නම - කුසුමා මැණික්පුරගේ වැඩිහිටි නිවාසය
- නේවසික සංඛ්‍යාව - 06 (ගැහැණු 05/ පිරිමි 01)
- කාර්ය මණ්ඩල - පාළිකා 2/සහය පාළිකා 1
- ලබාදුන් ආධාර මුදල/ වර්ෂය - රු.2,000,000.00/ 2023
- ව්‍යාපෘතිය - නේවාසිකාගාරය ඉදිකිරීම







- **වැඩිහිටි නිවාසය පිළිබඳ වෙනත් කරුණු**
  - 2008 වර්ෂයේ ආරම්භ කර ඇත.
  - නොමිලේ පවත්වාගෙන වන වැඩිහිටි නිවාසයකි.
  - ප්‍රාදේශීය ලේකම්ගේ සභාපතීත්වයෙන් යුත් පාලක සභාවක් මඟින් ක්‍රියාත්මක වේ.
  - පාලිකාව සඳහා පාලක සභාවෙන් මාසික වැටුප් ගෙවනු ලබන අතර, උප පාලිකාව සඳහා දෛනික වැටුප් ගෙවනු ලබයි.
  - NSE/SSP/HA/2024/103 අංකය යටතේ ලියාපදිංචි කර ඇති අතර, ලියාපදිංචි සහතිකයක් ලබා දී නොමැත.
  - වැඩිහිටි නිවාසයේ ලිපි ලේඛන අනුව, ආධාර වෙනුවෙන් මුදල් කුවිතාන්සිය නිකුත් කෙරේ.
  - ද්‍රව්‍ය ආධාර වෙනුවෙන්  කුවිතාන්සියක් නිකුත් නොකරයි.
  - වැඩිහිටි දීමනා ලාභීන් තිදෙනෙක් නේවාසිකව සිටී.
  - වැඩිහිටි නිවාස පරිශ්‍රය පිරිසිදුව හා පිළිවෙලට පවත්වාගෙනු යනු ලබයි.
  - වැඩිහිටි නිවාසය පිහිටා ඇති ඉඩම ප්රාදේශීය ලේකම්ට පවරා ඇත.
  - ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් ලබාදුන් ආධාර මුදලෙන් සාදා නිම කරන ලද පිරිමි නේවාසිකාගාරය (කාමර 3) භාවිතයට ගෙන නොමැත.
  - නේවාසික කාමර සඳහා ලී බඩු ඇතුළු භාණ්ඩ අවශ්‍ය වේ.
  - දැනට ගිලන් කාමර දෙකක් ස්ථාපිත කර ඇත.

05. **අවම පහසුකම් වැඩසටහන**

01. ව්‍යාපෘතියේ නම - වැසිකිලිය ඉදි කිරීම

02. ග්‍රාම නිලධාරි වසම - ඉහළ ඉඹුක්වැව

03. ප්‍රතිලාභියාගේ නම - කේ.ඒ.ඩී. හෙන්ද්‍රික් මයා

04. ප්‍රතිලාභියාගේ වයස - වයස අවුරුදු 75


05. ලබාදුන් මුදල/වර්ෂය - රු.100,000.00/ 2024

06. ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය - වැඩ අවසන් කර ඇත. භාවිතයට ගෙන ඇත.

07. වෙනත් කරුණු -

- ✓ වැඩිහිටි දීමනා හිමි පුද්ගලයෙකි.





**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - අඟුණකොළපැලැස්ස**

**වැඩිහිටි නිවාස පරීක්ෂා කිරීම**

- ග්‍රාම නිලධාරි වසම - බිංකම
- වැඩිහිටි නිවාසයේ නම - පාරම්පුර මාපිය සෙවන සරණ සේවා මධ්‍යස්ථානය
- නේවාසික සංඛ්‍යාව - වැඩිහිටියන් 11
  ගැහැණු 8/ පිරිමි 2/ පාළිකා 1
- වෙනත් කරුණු

  - පාළිකාව ස්වේච්ඡාවෙන් සේවය කරයි.
  - වැඩිහිටි දීමනාලාභීන් තිදෙනෙක් සිටී.
  - දකුණු පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ස.සේ/හම/00053/2010 අංකය යටතේ ලියාපදිංචි කර ඇත.
  - පාලක සභාවක් යටතේ වැඩිහිටි නිවාසය පාලනය වන අතර, ප්‍රාදේශීය ලේකම් ඒහි සභාපති ලෙස ක්‍රියා කරයි.
  - 2002 වර්ෂයේ ආරම්භ කර ඇත.
  - අක්කර 01ක භූමි ප්‍රමාණයක් ඇති අතර, ඉඩම ප්‍රාදේශීය සභාවට පවරා ඇත.
  - පාලිකාව ස්වේච්ඡා සේවයක් සපයනු ලබයි.
  - ඇතුළත් වීම සඳහා වැඩිහිටියන් 6 දෙනෙකුගෙන් අයදුම්පත් ලැබී ඇත.

  - වැඩිහිටි නිවාස ඉදිකිරීම හා අළුත්වැඩියා කිරීම යටතේ රු.2,000,000.00ක ආධාර මුදල ඉඩම වටා අලිවැට ගැසීමට ඉල්ලීම් කළ නමුත්, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයෙන් එම ප්‍රතිපාදන ලබා දී නොමැත.








ගිලන් කුටිය



06. අවම පහසුකම් වැඩසටහන

- ව්‍යාපෘතියේ නම - වැසිකිලිය ඉදි කිරීම
- ග්‍රාම නිලධාරි වසම - යකාගල
- ප්‍රතිලාභියාගේ නම - එස්.පී. මවුලිස් මයා
- ප්‍රතිලාභියාගේ වයස - අවුරුදු 76
- ලබාදුන් මුදල/වර්ෂය - රු.33,000.00/ 2024
- ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය - වැඩ අවසන් කර ඇත. භාවිතයට ගෙන ඇත.
- වෙනත් -
    - ✓ වැඩිහිටි දීමනා හිමි පුද්ගලයෙකි.





........................................................

කේ.චතුර මිහිදුම්

අධ්‍යක්ෂ

........................................................

ජේ.බී. ශ්‍රියාණි කාන්ති

වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි

...........................................................

රවින්ද්‍ර ගුණතිස්ස

වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි

...........................................................

එම්.එම්.එස්.එස්. ප්‍රනාන්දු

වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි

................................................

චානක චන්දිම

කළමනාකරණ නිලධාරි

වැඩිහිටි තැනැත්තන් සඳහා වන
ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய
சபை மற்றும் தேசிய செயலகம்
National Council and Secretariat for Elders

# මඩකලපුව දිස්ත්‍රික්කය

## පසු විපරම් වාර්තාව

## 2025.07.16

**ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය**

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

**ක්ෂේත්‍ර චාරිකා පසු විපරම් වාර්තාව**

**දිනය:** 2025/07/16

**වේලාව:** පෙ.ව. 8.30

**ස්ථානය:** දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරය, මඩකලපුව

## 1. හැඳින්වීම සහ සාකච්ඡාව

මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ සේවය කරන ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංවර්ධන නිලධාරීන් (වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්) හඳුන්වා දීමේ අවස්ථාවට ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ඇතුළු නිලධාරීන් සහභාගී වූහ. මඩකලපුව දිස්ත්‍රික් සහකාර ලේකම් (ගරු ප්‍රණවන් මහතා) විසින් උණුසුම් අයුරින් පිළිගන්නා ලදී.

**සාකච්ඡා වූ ප්‍රධාන කරුණු:**

- **ප්‍රජා ශක්ති ව්‍යාපෘතිය:** කෝරළේපත්තු දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුරුතනෙයි ප්‍රදේශයේ ආරම්භ කරන ලද "ප්‍රජා ශක්ති" වැඩසටහන පිළිබඳව පැහැදිලි කරන ලදී.
- **ප්‍රගති සමාලෝචනය:** 2024 වසරේ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වූ වැඩසටහන්වල ප්‍රගතිය සහ 2025 වසර සඳහා ජාතික ලේකම් කාර්යාලයට ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති යෝජනා පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කෙරිණි.
- **නිලධාරීන් දිරිමත් කිරීම:** මෙතෙක් ව්‍යාපෘති සඳහා අයදුම් නොකළ නිලධාරීන් දිරිමත් කිරීම සඳහා අයදුම් කරන ක්‍රමවේද සහ ජනතාවගේ අවශ්‍යතා හඳුනා ගැනීමේ ප්‍රවේශයන් පිළිබඳව උපදෙස් ලබා දෙන ලදී.
- **අස්වැසුම සහ හැඳුනුම්පත්:** අස්වැසුම සුභසාධන ප්‍රතිලාභ වැඩසටහන සහ හැඳුනුම්පත් නොමැති වැඩිහිටියන් සඳහා ඒවා ලබා දීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් කරන ලදී.
- **දත්ත පද්ධතිය:** නව අයදුම්පත් සම්පූර්ණ කරන ආකාරය, ඒවා යාවත්කාලීන කිරීම සහ සමාජ ආරක්ෂණ දත්ත පද්ධතියට (Social Security Database) ඇතුළත් කිරීම පිළිබඳව උපදෙස් මාලාවක් ලබා දෙන ලදී.
- **ඉදිරිපත් කිරීම්:** දිස්ත්‍රික්කයේ ප්‍රගති වාර්තා PPT මගින් ප්‍රදර්ශනය කර පැහැදිලි කරන ලද අතර, පවතින අඩුපාඩු සම්බන්ධයෙන් ප්‍රශ්න විමසන ලදී.


DISTRICT SECRETARIAT





## 2. ක්ෂේත්‍ර චාරිකාව සහ නිරීක්ෂණ

2025 වසරේ සහ ඊට පෙර වසරවල ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කරන ලදී. එහිදී මඩකලපුව දිස්ත්‍රික්කය සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් වෙන් කරන ලද ප්‍රතිපාදනවල භාවිතය නිරීක්ෂණය විය.

### I. අමිර්තකාලි වැඩිහිටි දිවා මධ්‍යස්ථානය

- මෙම මධ්‍යස්ථානය මගින් වැඩිහිටියන් විශාල පිරිසක් ප්‍රතිලාභ ලබති.
- තනිව වසන වැඩිහිටියන් මෙහි පැමිණ උදේ සහ දහවල් ආහාර ලබා ගනිමින් කාලය ගත කරති.
- **ගෙවතු වගාව:** මධ්‍යස්ථාන පරිශ්‍රයේ ගෙවතු වගාව සිදු කරන අතර, එම නිෂ්පාදන අලෙවි කර ලබා ගන්නා මුදලින් උපන් දින සැමරුම් සහ විනෝදාත්මක කටයුතු සංවිධානය කරති.
- **ස්වයං රැකියා:** අසල ක්‍රීඩා පිටියක් ඇති බැවින්, කෙටි ආහාර වර්ග සකස් කර අලෙවි කිරීමෙන් ලාභ උපයති.
- **අනෙකුත් ක්‍රියාකාරකම්:** විනෝද චාරිකා, වැඩිහිටි දින සැමරුම්, නායකත්ව පුහුණුව, වෛද්‍ය සායන, ක්‍රීඩා සහ ව්‍යායාම නිතිපතා පවත්වනු ලැබේ.



## II. "දිරිය පියස" නිවාස ව්‍යාපෘතිය

- **ප්‍රතිලාභියා:** මංගයර්කරසි මහත්මිය (මානසික සෞඛ්‍ය ගැටලු සහිත තැනැත්තියකි, දියණිය සමඟ වාසය කරයි).
- **ව්‍යාපෘති වටිනාකම:** රු. 700,000.00 (2023 වසරේ ව්‍යාපෘතිය).





**III. ස්වයං රැකියා ආධාර**

- **ප්‍රතිලාභියා:** සල්මා බීවී (මංමුනේ උතුර, මංජන්තොඩුවෙයි දකුණ).
- **ව්‍යාපෘතිය:** පැදුරු විවීම.
- **මූල්‍ය ආධාර:** රු. 50,000.00 (2024 වසරේ පිරිනමන ලදී).



**IV. කල්ලඩි මුහුතුවාරම් වැඩිහිටි සමිතිය**

- සමිතියේ මුළු සාමාජිකයින් 50ක් වන අතර ඉන් 45 දෙනෙකු හමුවී සාකච්ඡා කරන ලදී.
- සමිතියේ සභාපතිනිය ලෙස විශ්‍රාමික පරිපාලන නිලධාරිනියක් කටයුතු කරයි.
- ඔවුන්ගේ ආගමික, සංස්කෘතික සහ විනෝදාත්මක වැඩසටහන් නිරීක්ෂණය කරන ලදී.
- තනිව වසන වැඩිහිටියන්ගේ සුවදුක් විමසීම, සාමූහිකව උපන් දින සහ අභාවප්‍රාප්ත වූ සාමාජිකයන්ගේ අවසන් කටයුතු වෙනුවෙන් සහයෝගය දැක්වීම වැනි කටයුතු මෙහිදී අගය කෙරිණි.

.........................................................

කේ.චතුර මිහිදුම්

අධ්‍යක්ෂ

.........................................................

ඒ.එම්.අස්රි

වැඩිහිටි හිමිකම් ප්රවර්ධන නිලධාරි

............................................................

රවීන්ද්‍ර සුනිමල්

වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි

............................................................

එම්.සී.සී.පෙරේරා

කළමණාකරන සේවා නිලධාරි

වැඩිහිටි තැනැත්තන් සඳහා වන
ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய
சபை மற்றும் தேசிய செயலகம்
National Council and Secretariat for Elders

# පොළොන්නරුව දිස්ත්‍රික්කය

## ප්‍රගති සමාලෝචන රැස්වීම හා පසු විපරම් වාර්තාව

## 2025.08.15 / 16

## ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

**<u>පොළොන්නරුව දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම</u>**

දිනය - 2025.08.15

ස්ථානය - පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

ප්‍රධානත්වය - ඩී.ඩී.එස්. මුතුමාලි මිය, අතිරේක දිස්ත්‍රික් ලේකම්

සහභාගීත්වය -

1. කේ. චතුර මිහිඳුම් මයා - අධ්‍යක්ෂ, ජතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
2. කාන්ති අතපත්තු මැණිකේ මිය - දිස්ත්‍රික් වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි
3. ආර්.එච්.එන්.අයි. රත්නවීර මිය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - සමාජ සේවා නිලධාරි
4. ඕ.ජී. තුශාරි පද්මලතා මිය - මැදිරිගිරිය ප්‍රා.ලේ.කා - සංවර්ධන නිලධාරි (සමාජ සේවා)
5. එච්.එල්. චමිලා සමන්මලී මිය - තමන්කඩුව ප්‍රා.ලේ.කා - සංවර්ධන නිලධාරි (සමාජ සේවා)
6. කේ.ජී. ප්‍රේමලතා මිය - තමන්කඩුව ප්‍රා.ලේ.කා - සමාජ සේවා නිලධාරි (පළාත්)
7. බී.ආර්.එස්.කේ. රණතුංග මයා - ලංකාපුර ප්‍රා.ලේ.කා - සමාජ සේවා නිලධාරි
8. ටී.ඩී. ප්‍රියානි මංගලිකා මිය - හිඟුරක්ගොඩ ප්‍රා.ලේ.කා - සංවර්ධන නිලධාරි (සමාජ සේවා)
9. ඕ.ජී.ආර්. ප්‍රියදර්ශනී මිය - ලංකාපුර ප්‍රා.ලේ.කා - සංවර්ධන නිලධාරි ( පළාත් සමාජ සේවා)
10. ශිරාණි රේණුකා මිය - හිඟුරක්ගොඩ ප්‍රා.ලේ.කා - සමාජ සේවා නිලධාරි
11. ඒ.එන්. කරුණානායක මයා - මැදිරිගිරිය ප්‍රා.ලේ.කා - සමාජ සේවා නිලධාරි
12. ඕ.වී.යූ.ටී. වීරසේන මිය - දිඹුලාගල ප්‍රා.ලේ.කා - සංවර්ධන නිලධාරි ( පළාත් සමාජ සේවා)
13. බී.වී. සුමාලි සෙව්වන්දිකා මිය - දිඹුලාගල ප්‍රා.ලේ.කා - සංවර්ධන නිලධාරි ( වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන)
14. එස්.ඒ.සී. සිද්දිකා මිය - වැලිකන්ද ප්‍රා.ලේ.කා - සංවර්ධන නිලධාරි ( වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන)
15. ඩබ්.එම්. වත්සලා මිය - වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි - ප්‍රධාන කාර්යාලය
16. සුරේකා ශ්‍යාමිලා මිය - වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි - ප්‍රධාන කාර්යාලය
17. ඒ.එම්. අස්රි මයා - වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි - ප්‍රධාන කාර්යාලය
18. චානක චන්දිම මයා - කළමනාකරණ සේවා නිලධාරි - ප්‍රධාන කාර්යාලය

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය යටතේ 2024 වර්ෂයේ ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සම්බන්ධයෙන් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් නිලධාරීන්ගේ ප්‍රගතිය සමාලෝචනය කරන ලදී. තවද, 2025 වර්ෂයේ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයෙන් සිදු කරනු ලබන වැඩසටහන් සම්බන්ධව වැඩිදුරටත් දැනුවත් කිරීම සිදු කරන ලදී.

**ප්‍රගති සමාලෝචන රැස්වීමේදී සාකච්ඡා කරන ලද කරුණු.**

01. ඇළහැර -
   - පළාත් සමාජ සේවා නිලධාරියකු පමණක් සිටින අතර, රාජකාරී කටයුතු කිරීමේදී කිසිදු ගමන් වියදම් දීමනාවක් නොලබන බැවින්, රාජකාරී කටයුතු සඳහා මැදිහත්වීම අපහසු තත්ත්වයක පවතී.
   - මේ සඳහා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිළධාරියෙකු වැඩ ආවරණය සඳහා අනුයුක්ත කිරීම වඩා ප්‍රායෝගික වනු ඇත.

02. තමන්කඩුව - සමිති 51න් සමිති 48ක් ක්‍රියාකාරි මට්ටමේ පවතින බව අදාළ විෂය නිලධාරියා විසින් ප්‍රකාශ කරන ලදී.

03. දිඹුලාගල -
   - මහවැලි ඉඩම් හේතුවෙන් ඉඩමේ අයිතිය පිළිබඳ ගැටලු ඇති අතර, ඒ හේතුවෙන් අවම පහසුකම් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපහසු බව අදාළ විෂය නිලධාරියා විසින් ප්‍රකාශ කරන ලදී.
   - කොට්ඨාසය තුළ සමිති 52ක් පිහිටුවා ඇති අතර ඉන් සමිති 50ක් සක්‍රීය මට්ටමේ පවතී.

04. මැදිරිගිරිය - මෙම කොට්ඨාසය තුළ සමිති 43ක් පිහිටුවා ඇති අතර, මුස්ලිම් වසම් වල සමිති පිහිටුවීම අපහසු බව නිලධාරියා විසින් ප්‍රකාශ කරන ලදී.

05. ලංකාපුර -

   - පළාත් සමාජ සේවා හා මධ්‍යම රජයේ සමාජ සේවා නිලධාරි දෙදෙනෙක් මෙම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සේවය කරනු ලබයි.
   - සමිති පිහිටුවීමේදී මුස්ලිම් ජාතික වැඩිහිටියන් බහුල බැවින් සමිති පවත්වගෙන යාමේ ගැටළු පවතින බවත්, අලි උවදුර මෙම ප්‍රදේශයේ විශාල ගැටළුවක් බැවින් ගමනා ගමනය ඉතාම දුෂ්කර වේ.
   - මෙම කොට්ඨාසය තුළ සමිති 22ක් පිහිටුවා ඇති අතර, මුස්ලිම් ජන කොට්ඨාස වල අවශ්‍යතා හඳුනාගෙන සමිති පිහිටුවන ලෙසට උපදෙස් ලබා දෙන ලදී.

06. වැලිකන්ද -
   - වැඩිහිටි කමිටු ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කර නොමැති බවත්,
   - වැඩිහිටි නිවාස 01ක් පමණක් ලියාපදිංචි කිරීම.
   - වැඩිහිටි නිවාස 03ක් තාවකාලික ලියාපදංචිය සිදු කර ඇත.
   - දිරිය පියස ආධාර සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති නමුත් අදාළ ඉඩම් මහවැලි යෝජනා ක්‍රමය යටතේ වන ඉඩම් බැවින් ආධාර ලබාදීමට නොහැකි බව.
   - වැඩිහිටි සමිති 24ක් සක්‍රීය මට්ටමේ පවතී.
   - හෙල්ප්ඒජ් ආයතනය සහ යුධ හමුදාව මඟින් ඇස් කණ්නාඩි හා ශ්‍රවණ උපකරණ ලබා දුන් බැවින් ප්‍රධාන කාර්යාලයෙන් ඉල්ලීම් සිදු නොකිරීම.

07. හිඟුරක්ගොඩ -

- වැඩිහිටි කමිටු සවිබල ගැන්වීම යටතේ ලබා දී ඇති උපකරණ උපකරණ මෙතෙක් අදාළ සමිති වෙත බාරදී නොමැති බව,
- 2022/ 2025 වර්ෂ වල දිවා මධ්‍යස්ථානය ඉදි කිරීම සඳහා ලක්ෂ 11 ලබා දී ඇති අතර, මෙවර ඉතිරි මුදල් ලබා දෙන ලෙසට ඉල්ලීමක් කර ඇති බව,

**<u>රාජකාරී ඉටු කිරීමේදී මතුවන ගැටළු ඉදිරිපත් කිරීම.</u>**

- ➢ වැඩිහිටි දීමනාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉව්මිට්ස් සඳහා දත්ත ඇතුළත් කිරීම සෑම මසකම 10වන දිනය වන විට සිදු විය යුතු අතර, වැඩිහිටි දීමනා ගෙවීමේදී අස්වැසුම ලේඛනය ඒ එම කාලය තුල ලැබී නොතිබීම විශාල ගැටලුවක් වී ඇති බව.

- ➢ අස්වැසුම යටතේ වැඩිහිටි දීමනාලාභියෙකු මිය ගිය විට එම වැඩිහිටියා මියගියා සේ සැලකුවද එම ප්‍රතිලාභියාගේ මුදල් බැංකුවට බැර වන බවත්, මියගිය පුද්ගලයා සම්බන්ධව සමාජ ප්‍රතිලාභ මණ්ඩලය දැනුවත් කරන බවද ප්‍රකාශ කරන ලදී.

- ➢ සමාජ ප්‍රතිලාභ මණ්ඩලය වෙතින් නාමලේඛණය යොමු කරනුයේ සෑම මසකම 15 වන දින වන අතර, එම කාලය වන විට වැඩිහිටි දීමනා වවුචරය සකස් කර අවසන් බව ප්‍රකාශ කරන ලදී. එම අවස්ථාවේදී සිදු කළ හැක්කේ ප්‍රතිලාභීයාගේ නම ඉවත් කිරීම පමණක් බවත් නිලධාරීන් ප්‍රකාශ කරන ලදී. ඒ හේතුවෙන් වැඩිහිටි දීමනා මුදල් අධිභාර වන බවත්, විගණනයෙන් එම මුදල් සම්බන්ධව ගැටළු ඇති වන බවත් නිලධාරීන් ප්‍රකාශ කරන ලදී.

- ➢ අස්වැසුම පද්ධතියට දත්ත ඇතුළත් කිරීමේදී සංඥා පද්ධතියේ ඇති වන ගැටළු හේතුවෙන් දත්ත ඇතුළත් තිරීමට නොහැකි වීම.

- ➢ ඇඳන් ගත වැඩිහිටියන් සඳහා රැකවරණ මධ්‍යස්ථාන නොමැතිවීම හා රෝහල් ගතව සිටින වැඩිහිටියන් යොමු කිරීමට වැඩිහිටි නිවාස නොමැති වීම.

- ➢ පාසල් මට්ටමන් වැඩිහිටියන් සැලකීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීමට යෝජනා කරන ලදී.

- ➢ මෙහිදී සමාජ සේවා නිලධාරීන්ගේ ගැටළු සම්බන්ධව අවසන් වශයෙන් සාකච්ඡා කරන ලදී.




2024







ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් 2024 වර්ෂයේ ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සම්බන්ධයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ පසුවිපරම් කටයුතු සිදුකිරීම.

**දිනයන් - 2025.08.15 හා 16**

## 01. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - තමන්කඩුව

### I. ඇන්ජලා සිරිසේන මෙත සෙවන වැඩිහිටි නිවාසය

- ග්‍රාම නිලධාරි වසම - 198 ලක්ෂ උයන
- ආරම්භ කළ වර්ෂය - 2020
- නේවසික සංඛ්‍යාව - 15 (ගැහැණු 08/ පිරිමි 07)
- කාර්ය මණ්ඩල - පාළිකා 02/පාළක 02

වෙනත් කරුණු -

- ✓ නොමිලේ පවත්වාගෙන යයි.
- ✓ අක්කර 2ක ඉඩම් ප්‍රමාණය.
- ✓ කාමර 11ක් ඇත. ඉන් කාමර 8කට ඉඩ පහසුකම් ඇත.
- ✓ අවුරුදු 70- 75 වයස වැඩිහිටියන් වාසය කරයි.











## II. වැඩිහිටි සමිති සවිබලගැන්වීම වෙනුවෙන් ආධාර ලබාදීම.

- ග්‍රාම නිලධාරි වසම - අංක 200, සේවාගම
- දිවා සුරකුම් මධ්‍යස්ථානයේ නම - වැඩිහිටි දිවා සුරකුම් මධ්‍යස්ථානය, සේවාගම
- ලබාදුන් මුදල/වර්ෂය - රු.500,000.00 /2023-2024
- ලබාදුන් මුදලින් සිදු කරන ලද කාර්යයන් - දිවා සුරකුම් මධ්‍යස්ථානය අළුත්වැඩියාකර, තාප්පය ගසා ඇත.
- උපකරණ සඳහා රු.500,000/-ක මුදලක් ලබා දී ඇත. ආධාර වලින් කොටසක් ලබා දී ඇති බවත්, (රු.285,000/-) එම මුදලින් ශීත කරණය, ගෑස් ලිපක්, රයිස් කුකරු, කේතලය, මහන මැෂිම, පුටු මලදී ගෙන ඇත.
- වෙනත් කරුණු -
  - ✓ සභාපතිතුමා විසින් සභාව ආමන්ත්‍රණය කරන ලද අතර, සමිතියෙහි අතීතය හා දැනට පවත්වාගෙන යන ආකාරය පැහැදිලි කරන ලදී. තවද, අනාගතයේදී සිල්ලර කඩයක් ආරම්භ කර සමිතියට ආදායමක් ලබා ගන්නා බවත්, අවසන් වශයෙන් වැඩිහිටියන් විසින් වැඩිහිටි සමිති ගීතය ගායනා කරන ලදී.
  - ✓ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂතුමා ද සභාව අමතා අදහස් දක්වන ලදී.












## 02. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - දිඹුලාගල

### I. වැඩිහිටි දිවා මධ්‍යස්ථාන ඉදි කිරීම සඳහා ආධාර ලබා දීම

- ග්‍රාම නිලධාරි වසම - රත්මල්තැන්න, අරලගංවිල
- දිවා සුරකුම් මධ්‍යස්ථානයේ නම -රත්මල්තැන්න වැඩිහිටි දිවා සුරකුම් මධ්‍යස්ථානය
- ලබාදුන් මුදල/වර්ෂය - රු.3,500,000.00 / 2024
- ලබාදුන් මුදලින් සිදු කරන ලද කාර්යයන් - දිවා සුරැකුම් මධ්‍යස්ථානය සාදා නිම කළ ඇත.
- වෙනත් කරුණු -
  - ✓ සභාපතිතුමා විසින් සභාව ආමන්ත්‍රණය කරන ලදී.
  - ✓ මෙම කොට්ඨාසයේ වැඩිහිටි සමිති 56න් සමිති 46ක් සක්‍රීය මට්ටමේ පවතී.
  - ✓ මෙදින අරංගල වැඩිහිටි සමිතියේ සාමාජිකයින් නෑගම් ලෙස මෙම වැඩිහිටි සමිතිය වෙත පැමිණෙන ලදී.
  - ✓ වැඩිහිටි සමිතියෙහි සාමාජිකයින් හට වැඩිහිටි දීමනාව ලබා දෙන ලෙස වැඩිහිටි බල මණ්ඩලයේ සභාපතිතුමිය විසින් ඉල්ලීමක් සිදු කරන ලදී.
  - ✓ අධ්‍යක්ෂතුමා විසින් සභාව ආමන්ණය කරන ලද අතර, අස්වැසුම අයදුම්පත්‍ර සම්බන්ධව දැනුවත් කිරීමක් සිදු කරන ලදී.












## II. දිරිය පියස නිවාස යෝජනා ක්‍රමය


- ග්‍රාම නිලධාරි වසම - 207, මනංපිටිය
- ප්‍රතිලාභියාගේ නම - කමලා නීලවර්ණ මිය
- ප්‍රතිලාභියාගේ වයස- අවුරුදු 74
- ලබාදුන් මුදල/වර්ෂය- රු.700,000.00/ 202
- ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය - ව්‍යාපෘතිය අවසන් කර ඇත.
- වෙනත්-
    - ✓ වැඩිහිටි දීමනාව දෙදෙනාටම ලැබෙනවා.
    - ✓ වේවැල් කර්මාන්තයේ සිදු කරනවා.






බුලත් විට
විකිණීමට
ඇත.





## III. අවම පහසුකම් වැඩසටහන

- ව්‍යාපෘතියේ නම - වහලය සෑදීම
- ග්‍රාම නිලධාරී වසම - 210, දළුකාන
- ප්‍රතිලාභියාගේ නම - ගුණවතී රාජපක්ෂ මිය
- ප්‍රතිලාභියාගේ වයස - වයස අවුරුදු 88
- ලබාදුන් මුදල/වර්ෂය - රු.100,000.00/ 2024
- ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය - වහලය සාදා ඇති නමුත්, වහලය මැදින් ගිලා බැස ඇත. එම කොට්ඨාසයේ නිලධාරියා දැනුවත් කරන නැවත එය පිළිසකර දෙන ලෙසට උපදෙස් ලබා දෙන ලදී.
- වෙනත් කරුණු -
  - ✓ වැඩිහිටි දීමනාව කුඩාවැව තැපැල් කන්තෝරුවෙන් ලබා ගනී.
  - ✓ තනිව ජීවත් වෙයි.











## 03. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - වැලිකන්ද

### I. වැඩිහිටි නිවාසය


- ග්‍රාම නිලධාරි වසම - 261, සෙවන පිටිය
- වැඩිහිටි නිවාසයේ නම - රාහුලාලංකාර භික්ෂු ගිලනෝපස්ථාන මධ්‍යස්ථානය
- නේවසික සංඛ්‍යාව - ස්වාමීන්වහන්සේලා 03/ පිරිමි 04
- කාර්ය මණ්ඩල - සේවකයන් නොමැත.
- **වැඩිහිටි නිවාසය පිළිබඳ වෙනත් කරුණු**

✓ නොමිලේ පවත්වාගෙන වන වැඩිහිටි නිවාසයකි.

✓ වැඩිහිටි නිවාස පරිශ්‍රය පිරිසිදුව හා පිළිවෙලට පවත්වාගෙනු යනු ලබයි.

✓ ගොඩනැගිල්ලක් සාදා දෙන ලෙසට ඉල්ලීමක් සිදු කරයි.

✓ අලි උවදුර පවතී












II. **දිරිය පියස වැඩසටහන**

01. ග්‍රාම නිලධාරි වසම - 195, ඕනෑගම

02. ප්‍රතිලාභියාගේ නම - ඇල්බට් මයා

03. ප්‍රතිලාභියාගේ වයස - වයස අවුරුදු 90

04. ලබාදුන් මුදල/වර්ෂය - රු.700,000.00/ 2024

05. ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය - වැඩ අවසන් කර ඇත.

06. වෙනත් කරුණු - වැඩිහිටි දීමනා හිමි පුද්ගලයෙකි.











## 04. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - හිඟුරක්ගොඩ

I. **ස්වයං රැකියා ආධාර ලබා දීම.**

- ග්‍රාම නිලධාරි වසම - පුරාණගම
- ප්‍රතිලාභියාගේ නම - ඊ්.පී. ඇග්නස් මිය
- ප්‍රතිලාභියාගේ වයස - වයස අවුරුදු 76
- ලබාදුන් මුදල/වර්ෂය - රු.22,300.00/ 2024
- වැඩිහිටි නිවාසයේ නම - ඇඳුම් මැසීම
- වෙනත් කරුණු-
    - ✓ අමු ද්‍රව්‍ය ලබා ගැනීම. (රෙදි, බොත්තම් හා ඉලාස්ටික්)
    - ✓ වැඩිහිටි දීමනාව තැපැල් කන්තෝරුවෙන් ලබා ගනී.








III. **ස්වයං රැකියා වැඩසටහන**

- ග්‍රාම නිලධාරි වසම - 63, යෝධ ඇල
- ප්‍රතිලාභියාගේ නම - ඇම්.ඇම්. ලීලාවතී මිය
- ප්‍රතිලාභියාගේ වයස - වයස අවුරුදු 70
- ලබාදුන් මුදල/වර්ෂය - රු.36,000.00/ 2024
- වෙනත් -
  - ✓ තහඩු හා තරාදි මිලදී ගෙන ඇත.
  - ✓ වැඩිහිටි දීමනා හිමි පුද්ගලයෙකි.




ALPHA
DIGITAL PRICE COMPUTING SCALE







ඇම්.ඇම්. ලීලාවතී මිය විසින් දිරිය පියස නිවාස යෝජනා ක්‍රමය යටතේ නිවාසයක් ඉදි කර ගැනීමට අයදුම්පත්‍රයක් යොමු කර ඇත.





## IV. වැඩිහිටි දිවා මධ්‍යස්ථාන ඉදි කිරීම සඳහා ආධාර ලබා දීම

- ග්‍රාම නිලධාරි වසම - 61, යටියල්පතාන
- දිවා සුරකුම් මධ්‍යස්ථානයේ නම - රන්කොත්ගම වැඩිහිටි දිවා සුරකුම් මධ්‍යස්ථානය
- ලබාදුන් මුදල/වර්ෂය - රු.1,100,000.00 / 2022-2023
- ලබාදුන් මුදලින් සිදු කරන ලද කාර්යයන් - දිවා සුරැකුම් මධ්‍යස්ථානය වැඩ අවසන් කර නැත.
- වෙනත් කරුණු -
    - ✓ පර්චස් 18ක ඉඩම පිහිටා ඇත.
    - ✓ සාමාජිකයින් 80ක් ඉන්නවා
    - ✓ 2000 වර්ෂයේ මෙම සමිතිය ආරම්භ කර ඇත.
    - ✓ සාමාජික මුදල රුත30/-ක් අය කරයි.
    - ✓ ඉතිරි මදල ලබා ගැනීම සඳහා ඇස්තමේන්තු සකස් කර ප්‍රධාන කාර්යාලය වෙත යොමු කර ඇත.











## 05.ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - මැදිරිගිරිය

### I. වැඩිහිටි කමිටු සඳහා භාණ්ඩ ලබා දීම


- ග්‍රාම නිලධාරි වසම - 88, දියසෙන්පුර
- දිවා සුරකුම් මධ්‍යස්ථානයේ නම -දියසෙන්පුර ග්‍රාමීය වැඩිහිටි කමිටුව
- ලබාදුන් මුදල/වර්ෂය - රු.100,000.00 / 2023
- ලබාදුන් මුදලින් සිදු කරන ලද කාර්යයන් - කබඩ් 01, මේස 01 හා පුටු 37 ක් මිලදී ගෙන ඇත.
- වෙනත් කරුණු -
    - ✓ 2009 ආරම්භ කරන ලදී.
    - ✓ සාමාජිකයින් 70-80ක් පමණ ඇත.
    - ✓ කමිටුව ලියාපදංචි කර ඇත. (NSE/2014/2706140/NCP)











II. **ස්වයං රැකියා වැඩසටහන**

- ව්‍යාපෘතියේ නම - අමුද්‍රව්‍ය මිලදී ගැනීම ( රෙදි හා ඉලාස්ටික්)
- ග්‍රාම නිලධාරි වසම - 99, වේදේහපුර
- ප්‍රතිලාභියාගේ නම - ඩබ්.එම්. ලොකුමැණිකේ මිය
- ප්‍රතිලාභියාගේ වයස - වයස අවුරුදු 70
- ලබාදුන් මුදල/වර්ෂය - රු.25,000.00/ 2023
- වෙනත් -
    - ✓ වැඩිහිටි දීමනාව තැපැල් කන්තෝරුවෙන් ලබා ගනී.











III. **ශ්‍රවණ උපකරණ ලබා දීම**

- ග්‍රාම නිලධාරි වසම - 84, දිවුලන්කඩවල
- ප්‍රතිලාභියාගේ නම - පී.ඒ. සෝමාවතී මිය
- ප්‍රතිලාභියාගේ වයස - වයස අවුරුදු 84
- ලබාදුන් මුදල/වර්ෂය - 2024
- වෙනත් -
    - ✓ වැඩිහිටි දීමනාව තැපැල් කන්තෝරුවෙන් ලබා ගනී.
    - ✓ ක්‍රියාකාරි මට්ටමේ උපකරණය ඇත.





........................................................

කේ.චතුර මිහිදුම්

අධ්‍යක්ෂ

........................................................

ඩබ්.එම්. වත්සලා

වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි

...........................................................

එම්.එම්.එස්.එස්. ප්‍රනාන්දු

වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි

...........................................................

ඒ.එම්. අස්රි

වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි

................................................

චානක චන්දිම

කළමනාකරණ නිලධාරි

වැඩිහිටි තැනැත්තන් සඳහා වන
ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய
சபை மற்றும் தேசிய செயலகம்
National Council and Secretariat for Elders

# යාපනය දිස්ත්‍රික්කය

## පසු විපරම් වාර්තාව

## 2025.08.17

**ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය**

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් 2024 වර්ෂයේ ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සම්බන්ධයෙන් යාපනය දිස්ත්‍රික්කයේ පසුවිපරම් කටයුතු සිදුකිරීම.

**දිනයන් - 2025.08.17**

**01.තරුණ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන**







## 02. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - Valikamam South West / සංදිලිපායි

I. Kalvalai Elders Day Centers

- ග්‍රාම නිලධාරි වසම - J / 142
- ආරම්භ කළ වර්ෂය - 2012
- සාමාජිකයින් සංඛ්‍යාව - 78
- ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ලියාපදිංචි අංකය - NSE/2012/4109/NP
- වෙනත්
  - වන්දනා චාරිකා සඳහා ලබා දෙන ආධාර මුදල් ප්‍රමාණය ඉහළ දැමීම.
  - දිවා මධ්‍යස්ථානය සඳහා උපකරණ මිලදී ගැනීමට රු.500,000/-ක මුදලක් ලබා දී ඇත.
  - රු.2,000/- වැඩිහිටි දීමනවා රු.5,000/-ක් ස්තුති කරන ලදී.














கல்வளை முதியோர்
பகல் பராமரிப்பு நிலையம்
KALVALAI ELDERS DAY CARE CENTRE



II. **ස්වයං රැකියා ආධාර ලබා දීම.**

- ග්‍රාම නිලධාරි වසම - යේනුතිනාපතාන්
- ප්‍රතිලාභියාගේ නම - බාලසිංහම් පුෂ්පරාණි මිය
- ප්‍රතිලාභියාගේ වයස - වයස අවුරුදු 71
- ලබාදුන් මුදල/වර්ෂය - රු. 50,000.00/ 2024
- වැඩිහිටි නිවාසයේ නම - එළවළු විකුණන මේසය හා එළවළු දැමීම සඳහා පෙට්ටියක් සාදා ඇත.
- වෙනත් කරුණු-
  - ✓ දිනක ආදායම රු. 2,000/-කි. ඇයගේ ලාභය රු.1,000/-ක් පමණ ඇති බව ප්‍රකාශ කරන ලදී.
  - ✓ 7km දුර ගෙවා පොළට පැමිනෙයි.
  - ✓ වැඩිහිටි දීමනාව තැපැල් කන්තෝරුවෙන් ලබා ගනී.







## III. අවම පහසුකම් වැඩසටහන

- ග්‍රාම නිලධාරි වසම - 148 සන්දිලිපායි
- ප්‍රතිලාභියාගේ නම - රාසරතනම් තේන්කිලි මිය
- ප්‍රතිලාභියාගේ වයස - වයස අවුරුදු 75
- ලබාදුන් මුදල/වර්ෂය - රු.38,000.00/ 2023
- ව්‍යාපෘතිය - ඇඳක් හා මෙට්ටයක් ලබාදීම.
- වෙනත් කරුණු -
    - ✓ රු.15,000/-ක මුදලක් අස්වැසුම මඟින් ලබා ගනී.
    - ✓ වැඩිහිටි දීමනාව ද ලබා ගනී.
    - ✓





## IV. අවම පහසුකම් වැඩසටහන

- ග්‍රාම නිලධාරි වසම - 148 සන්දිලිපායි
- ප්‍රතිලාභියාගේ නම - නඩරාසා අප්පා සෙල්වම් මිය
- ප්‍රතිලාභියාගේ වයස - වයස අවුරුදු 77
- ලබාදුන් මුදල/වර්ෂය - රු.38,000.00/ 2023
- ව්‍යාපෘතිය - ඇඳක් හා මෙට්ටයක් ලබාදීම.
- වෙනත් කරුණු -
  - ✓ අස්වැසුම හා වැඩිහිටි දීමනාව ලබා ගනී.





## 01. සියවස් පූර්ණ වැඩිහිටියා

- ග්‍රාම නිලධාරි වසම - ජේ/ 153
- ප්‍රතිලාභියාගේ නම - සුබ්‍රමනියම් වල්ලිඅම්මා මිය
- ප්‍රතිලාභියාගේ වයස - අවුරුදු 101
- වෙනත් කරුණු -
    - ✓ දරුවන් 13ක් ඇත. දැනට දරුවන් 6ක ජීවත්ව සිටිති.
    - ✓ පිරිමි දරුවන් 8ක් සහ ගැහැණු දරුවන් 5කි.
    - ✓ සියවස් පූර්ණ දීමනාව හිමිය.









## V. දිරිය පියස නිවාස යෝජනා ක්‍රමය

- ග්‍රාම නිලධාරි වසම - 153
- ප්‍රතිලාභියාගේ නම - බවරත්තිනම් ජයමෙනි මිය
- ප්‍රතිලාභියාගේ වයස- අවුරුදු 77
- ලබාදුන් මුදල/වර්ෂය- රු.700,000.00/ 2024
- ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය - ව්‍යාපෘතිය අවසන් කර ඇත.
- වෙනත්-
  - ✓ අස්වැසුම දීමනාව හා ආබාධිත දීමනාව හිමිය.
  - ✓ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ආධාර හා ගම්වාසීන්ගේ ආධාර මඟින් දිරිය පියස නිවාසයේ වැඩ අවසන් කර ඇත.
  - ✓ ආබාධිත දරුවන් දෙදෙනෙක් සිටී.
  - ✓ මාසිකව රු.10,000/-ක මුදලක් ගෙවා සේවිකාවක් මඟින් ආබාධිත දරුවන් රැකබලා ගනී.
  - ✓ නැන්දනිය යටතේ මොවුන් සිටී.











## කිළිනොච්චි දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම

දිනය - 2025.08.18

ස්ථානය - කිළිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

ප්‍රධානත්වය - එස්. මුරලිදරන් මහතා, දිස්ත්‍රික් ලේකම්

කේ. චතුර මිහිදුම් මහතා - අධ්‍යක්ෂ , ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

දිස්ත්‍රික් ලේකම් හා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂතුමා අතර ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් සිදුකරනු ලබන වැඩසටහන් සම්බන්ධව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවතින පුරප්පාඩු සම්බන්ධව සාකච්ජාවෙන් පසුව ප්‍රගති සමාලෝචන රැස්විම ආරම්භ විය













.......................................................

කේ.චතුර මිහිදුම්

අධ්‍යක්ෂ

.......................................................

ඩබ්.එම්. වත්සලා

වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි

..........................................................

එම්.එම්.එස්.එස්. ප්‍රනාන්දු

වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි

..........................................................

ඒ.එම්. අස්රි

වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි

...............................................

චානක චන්දිම

කළමනාකරණ නිලධාරි

වැඩිහිටි තැනැත්තන් සඳහා වන
ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய
சபை மற்றும் தேசிய செயலகம்
National Council and Secretariat for Elders

# අම්පාර දිස්ත්‍රික්කය

## පසු විපරම් වාර්තාව

## 2025.10.14

## ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් 2024 වර්ෂයේ ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සම්බන්ධයෙන් අම්පාර දිස්ත්‍රික්කයේ දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පසුවිපරම් කටයුතු සිදුකිරීම.

**දිනය - 2025.10.14**

**01. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - දෙහිඅත්තකණ්ඩිය**

**I. වැඩිහිටි නිවාස පරීක්ෂා කිරීම**

- ග්‍රාම නිලධාරි වසම - සඳමඩුල්ල
- වැඩිහිටි නිවාසයේ නම - සරණ වැඩිහිටි නිවාසය
- නේවාසික සංඛ්‍යාව - 11 (පිරිමි)
- කාර්ය මණ්ඩල - පාළක 01 /සහය පාළක 01
- ලබාදුන් ආධාර මුදල/ වර්ෂය - රු.2,000,000.00/ 2023
- ව්‍යාපෘතිය - නේවාසිකාගාරය ඉදිකිරීම
- වෙනත්
  - ✓ 2021 වර්ෂයේ ආරම්භ කර ඇත.
  - ✓ පාලක සභාවෙන් පාලනය වේ.
  - ✓ NSE/EP/AMP/2021/33 (ජා.වැ.ම.කා - කොළඹ) යන අංකයෙන් ලියාපදිංචි වී ඇත.
  - ✓ ඇඳගත වැඩිහිටියන් දෙදෙනෙකි.
  - ✓ වැඩිහිටියන් 6 දෙනෙකුට වෙත වැඩිහිටි දීමනාව හිමිය.
  - ✓ මෙම නිවාසය සඳහා ලංකා බැංකු ගිණුමක් ඇත.(4702020)
  - ✓ දාන හා වියළි සාලාක ලැබේ.
  - ✓ මුදල් සඳහා රිසිට් පතක් නිකුත් කරනු ලැබේ.
  - ✓ සාලාක ලැබීමේදී රිසිට් පතක් නිකුත් නොකරන අතර, ඒ සඳහා පොතක් පවත්වාගෙන යනු ලබයි.
  - ✓ ගිණුම් හා අනෙකුත් වාර්තා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත මාස 3කට වරක් යොමු කරයි.
  - ✓ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ විසින් වැඩිහිටි නිවාස ශ්‍රේණිගත කිරීමේදී මෙම වැඩිහිටි නිවාසය සී ශ්‍රේණයේ නිවාසයකි.
  - ✓ වැඩිහිටියන් ඇතුළත් කිරීමට හැකි නමුත් ප්‍රමාණවත් සේවක පිරිසක් නොමැති වීම.

<u>අදහස් හා යෝජනා</u>

01. සලාක වලට රිසිට් පතක් ලබාදෙන ලෙස උපදෙස් ලබා දෙන ලදී.
02. සහය පාලකගේ වැටුප ප්‍රමාණවත් නොවීම.







**02.** සුවපහසු මූලාධාර වැඩසටහන

- ව්‍යාපෘතියේ නම - ඇඳක් හා මෙට්ටයක්
- ග්‍රාම නිලධාරී වසම - ලිහිණියාගම
- ප්‍රතිලාභියාගේ නම - ජී. ගුණවතී මිය
- ප්‍රතිලාභියාගේ වයස - අවුරුදු 74
- ලබාදුන් මුදල/වර්ෂය - රු. / 2024
- වෙනත් කරුණු -
  - ✓ වැඩිහිටි දීමනාව හා අස්වැසුම්ලාභී පුද්ගලයෙකි.

**03.** සුවපහසු මූලාධාර වැඩසටහන

- ව්‍යාපෘතියේ නම - ඇඳක් හා මෙට්ටයක්
- ග්‍රාම නිලධාරී වසම - ලිහිණියාගම
- ප්‍රතිලාභියාගේ නම - වයි.බී. කරුණාවතී මිය
- ප්‍රතිලාභියාගේ වයස - අවුරුදු 74
- ලබාදුන් මුදල/වර්ෂය - රු. / 2024
- වෙනත් කරුණු -
  - ✓ වැඩිහිටි දීමනාව හිමි පුද්ගලයෙකි.





04. ස්වයංරැකියා ආධාර ලබාදීම

- ව්‍යාපෘතියේ නම - ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට සැපයීම
- ග්‍රාම නිලධාරි වසම - ලිහිණියාගම
- ප්‍රතිලාභියාගේ නම - ටී. ගාමිණී විජේතුංග මයා
- ප්‍රතිලාභියාගේ වයස - අවුරුදු 64
- ලබාදුන් මුදල/වර්ෂය - රු.50,000.00/ 2023
- ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය - සාමාන්‍ය ක්‍රියාකාරි මට්ටමේ පවතී.
- වෙනත් කරුණු -
    - ✓ මේ සඳහා භාවිතා කිරීමට අදාළව ශබ්ද විකාශන යන්ත්‍ර හා බෆල් ඇත.
    - ✓ බෆර් මිලදී ගැනීම සඳහා මුදල් ඉල්ලීම් කරන ලදී.








**05. ආදී වාසි ගම්මනායේ සියවස් පූර්ණ වැඩිහිටියා**

- ග්‍රාම නිලධාරි වසම - හෙනානිගල දකුණ
- ප්‍රතිලාභියාගේ නම - යූ.ඩබ්. හිනී මිය
- ප්‍රතිලාභියාගේ වයස - අවුරුදු 108
- වෙනත් කරුණු -
    - ✓ දරුවන් 8ක් ඇත.
    - ✓ සියවස් පූර්ණ, අස්වැසුම හා වැඩිහිටි දීමනාව හිමිය.

**06. ආදී වාසි ගම්මනායේ දරුවන් 14ක් සිටින වැඩිහිටියා**

- ග්‍රාම නිලධාරි වසම - හෙනානිගල දකුණ
- ප්‍රතිලාභියාගේ නම - බණ්ඩාර මැණිකේ මිය
- ප්‍රතිලාභියාගේ වයස - අවුරුදු 75
- වෙනත් කරුණු -
    - ✓ දරුවන් 14ක් ඇත.
    - ✓ අස්වැසුම හා වැඩිහිටි දීමනාව ලැබෙනවා.







**07. ළිහිණියාගම ළිහිණි ජයමග ජ්‍යෙෂ්ඨ පුරවැසි සමිතිය**

- ග්‍රාම නිලධාරි වසම - ළිහිණියාගම
- වැඩිහිටි සමිතියේ නම - ළිහිණියාගම ළිහිණි ජයමග ජ්‍යෙෂ්ඨ පුරවැසි සමිතිය
- ආරම්භ කරන ලද වර්ෂය - 2008
- ලබාදුන් මුදල/වර්ෂය - රු.100,000.00 /2024
- මිලදී ගන්නා ලද භාණ්ඩ - ප්ලාස්ටික් පුටු 40ක්, ලියන මේසයක්, වුතර ජෝගු 2ක්, පිරිසි කෝප්ප 15ක් හා ප්‍රථමාධාර පෙට්ටියක් මිලදී ගෙන ඇත.
- වෙනත් කරුණු -
    - ✓ ඉහත සමිතිය විශේෂ රැස්වීම් වාරයක් පවත්වන ලද අතර, එහි ගරු ලේකම්තුමා විසින් අධ්‍යක්ෂතුමා ඇතුළු සහභාගී වූ නිලධාරීන් පිළිගන්නා ලදී.
    - ✓ සාමාජිකයින් 106ක්
    - ✓ මාසයේ පළමු සෙනසුරාදා දින මාසික පොළක් පවත්වනු ලබයි.
    - ✓ එක් සාමාජිකයෙකුගෙන් මාසිකව රු.100/-ක් අය කෙරේ.
    - ✓ අළුත් සාමාජිකයෙකු බඳවා ගැනීමේදී රු.300/-ක් අය කෙරේ.
    - ✓ වාර්ෂික සාමාජික මුදල රු.500/-කි.
    - ✓ වන්දනා චාරිකා සඳහා රු.50,000/-ක මුදල ලැබී ඇත.
    - ✓ වැඩිහිටි දිනය වෙනුවෙන් කොඩි දිනයේ කොඩි අලෙවි කර රු.17,221/-ක් අදායමක් ලබා ඇත.
    - ✓ කොඩි අලෙවියේදී නිශ්චිත මුදලක් නොව කැටය තුළට කැමති මුදලක් ලබා ගන්නා ලදී.
    - ✓ වාර්ෂික වැඩසැලැස්මක් ඇත.
    - ✓ සෑම මසකම 25 වෙනිදා මහා සභා රැස්වීම පවත්වනු ලබයි.
    - ✓ ලංකා බැංකුවේ ගිණුම් 2ක් ඇත.
    - ✓ සහන ගිණුම - මාසික පොළේ ආදායම මෙම ගිණුමට බැර කරයි.
    - ✓ සාමාජිකයෙකු රෝහල් ගත කළ විට රු.2,500/-ක මුදලක් හා රු.1,000/-ක පෝෂණ මල්ලක් සහන ගිණුමේ තැන්පතු මුදලින් ලබාදෙනු ලබන අතර, මේ වන විට සාමාජිකයින් 70 දෙනෙකු වෙත ලබා දී ඇත.
    - ✓ රු.12,000/-ක මරණාධාර පාරිතෝෂකය ලබා දෙනු ලැබේ.
    - ✓ මහාසභා ගිණුම වෙත (ලක්ෂ දෙකකට ආසන්න මුදලක්) වාර්ෂික සාමාජික මුදල බැර කරනු ලැබේ.
    - ✓ සාමාජිකයෙකු අසනීප වූ විට රු.5,000/-ක සහන පොලියකට ණය මුදලක් ලබා දෙනු ලැබේ.




Ii Jj Kk Ll
Mm Nn Oo P
Qq Rr Ss Tt
Uu Vv Ww Xx
Zz


Ii Jj Kk Ll
Mm Nn Oo P
Qq Rr Ss Tt
Uu Vv Ww Xx
Yy
Zz

.......................................................

කේ.චතුර මිහිදුම්

අධ්‍යක්ෂ

.......................................................

පබසරා කුමාරි

වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි

..........................................................

ඒ.එම්. අස්රි

වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි

..........................................................

එම්.එම්.එස්.එස්. ප්‍රනාන්දු

වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි

...............................................

චානක චන්දිම

කළමණාකරන සේවා නිලධාරි

වැඩිහිටි තැනැත්තන් සඳහා වන
ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய
சபை மற்றும் தேசிய செயலகம்
National Council and Secretariat for Elders

# කළුතර දිස්ත්‍රික්කය

## පසු විපරම් වාර්තාව

## 2025.11.04

## ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් 2024 වර්ෂයේ ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සම්බන්ධයෙන් කළුතර දිස්ත්‍රික්කයේ කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පසුවිපරම් කටයුතු සිදුකිරීම.


**දිනය - 2025.11.04**

**01.** ආරෝග්‍යා වැඩසටහන

- ග්‍රාම නිලධාරි වසම - 731, කලමුල්ල උතුර
- ප්‍රතිලාභියාගේ නම - එස්.ජේ.පී. සිල්වා මිය
- රෝගී තත්ත්වය - පිළිකා රෝගය
- ප්‍රතිලාභියාගේ ලිපිනය - පාතිමා මාවත, කලමුල්ල, කළුතර
- ලබාදුන් මුදල/වර්ෂය - 25,000.00 / 2023
- වෙනත් කරුණු -
  - ✓ අස්වැසුම්ලාභී පුද්ගලයෙකි.
  - ✓ උකුල් ඇට අබාධය හා සන්දි ආශ්‍රිත රෝගය ඇත.







02. ස්වයංරැකියා ආධාර ලබාදීම

- ව්‍යාපෘතියේ නම - සිල්ලර කඩයක් පවත්වාගෙන යාම සඳහා භාණ්ඩ ගැනීම.
- ග්‍රාම නිලධාරි වසම - තේක්කවත්ත
- ප්‍රතිලාභියාගේ නම - ටී. ගාමිණී විජේතුංග මයා
- ප්‍රතිලාභියාගේ ලිපිනය - භික්ෂු විවේකාරාම ඉදිරිපිට, තේක්කවත්ත, පළාතොට
- ලබාදුන් මුදල/වර්ෂය - රු.50,000.00/ 2024
- ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය - ක්‍රියාකාරි මට්ටමේ පවතී.
- වෙනත් කරුණු -
  - ✓ දිනකට රු.600/-ක ආදායමක් ලබයි.
  - ✓ වැඩිහිටි දීමනාව හා අස්වැසුම්ලාභී පුද්ගලයෙකි.
  - ✓ කඩකුලිය මාසිකව රු.7,000/-ක් ගෙවනු ලබයි.






**03.** සුවපහසු මූලාධාර වැඩසටහන

- ව්‍යාපෘතියේ නම - කොමඩ් වැසිකිලියක්
- ග්‍රාම නිලධාරි වසම - 729 එච්
- ප්‍රතිලාභියාගේ නම - කේ.පී. විමලාවතී මිය
- ප්‍රතිලාභියාගේ ලිපිනය - 160, ගමගොඩ පාර, රජවත්ත
- ලබාදුන් මුදල/වර්ෂය - රු. 50,000.00 / 2025
- වෙනත් කරුණු -
  - ✓ අස්වැසුම හිමි පුද්ගලයෙකි.





.......................................................

කේ.චතුර මිහිදුම්

අධ්‍යක්ෂ

.......................................................

ගයනි අනුජා මෙය

සමාජ සේවා නිලධාරි

..........................................................

සෙව්වන්දි කාංචනමාලා

සංවර්ධන නිලධාරි (වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන)

..........................................................

ඒ.එම්. අශ්රි

වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි

...............................................

චානක චන්දිම

කළමනාකරණ නිලධාරි